# පළමුවැනි පරිශිෂ්ටය

(අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1967 දී **පනවන** ලද, ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ බැංකු ආයතන කටයුතු හා ගනුදෙනු වලට අදාළ කොටස්.

(ආ) 1967 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

(අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1967 දී පනවන ලද ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ ලංකාවේ අනෙකුත් බැංකු ආයතනවල කටයුතු හා ගනුදෙනු වලට අදාළ කොටස්.

**1967 අංක: 15 දරන විසර්ජන පනත.**

1967 - 68 මුදල් වර්ෂයේ සේවා සඳහාද, එවැනි සේවා සඳහා ලංකාව තුළින් හෝ පිටතින් හෝ ණය ලබා ගැනීමට බලය පැවරීම සඳහාද, එම මුදල් වර්ෂය තුළ රජයේ සමහර කටයුතු සම්බන්ධයෙන්, මුදල් වෙන් කිරීම සඳහාද, එම මුදල් වර්ෂය තුළ එවැනි කටයුතු සඳහා වියදම් කිරීම සඳහාද, ලංකාවේ ඒකා-බද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමටද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවීමට ඉඩ සැලසීමටද, ඉහත කී කටයුතු වලට සම්බන්ධිතව හෝ ආනුෂංගිකව හෝ ඇති කරුණු සඳහා ඉඩ සැලසීමටද, බලය පැවරෙන පනතකි.

**(සම්මත වූ දිනය: 1967 සැප්තැම්බර් 29)**

1. මේ පනත, 1967 අංක 61 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කුමන හෝ වියදමක් සඳහා බලය පැවරෙන වෙනත් අනෙක් නීතියකට හානියක් නොවන පරිද්දෙන්, 1967 ඔක්තෝබර් 1 වැනිදසින් පටන් ගෙන 1968 සැප්තැම්බර් 30 වැනිදසින් අවසන් වන මුදල් වර්ෂයේ සේවාවන් සඳහා තක්සේරු කරන ලද රජයේ වියදම රුපියල් දෙසිය හැටතුන් කෝටි දහසය ලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය හතළිස් හතකි.

(අ ) මෙයින් බලය පැවරෙන ගෙවීම්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ මුදල් වලින්ද, සහ,

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් හෝ සඳහා හෝ ලංකාව තුළින් හෝ පිටතින් හෝ මුළු වශයෙන් රුපියල් අනූනව කෝටි පන් ලක්ෂයකට නොවැඩිව ලබා ගැනීමට මෙයින් බලය පැවරෙන ණය වලින්ද, ලබා ගත යුතුය.

මෙහි මීත් පෙර සඳහන් රුපියල් දෙසිය හැටතුන් කෝටි දහසය ලක්ෂ හැත්තෑ අට දහස් හතළිස් හත මේ පනතෙහි පළමුවැනි උප ලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

(2) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේදී, රජය සඳහා හෝ වෙනුවෙන් හෝ ණය ගැනීම සඳහා බලය පැවරෙන වෙනත් කුමන හෝ ලිඛිත නීතියක විධිවිධාන වලට හානියක් නොවිය යුතුය.

3. (1) මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත, ඒ ඒ කාර්යයන් සඳහා 11 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ රජයේ ලැබීම්, ඒ ඒ කාර්යයන් සඳහා වෙන් වූ ගිණුමට බැර කළ යුතුය. එහෙත්, එසේ බැර කරනු ලැබීම්, එම ලේඛනයෙහි 111 වැනි තීරුවෙහි, අනුරූප සටහනේ, නියමිත උපරිම සීමාව, නො ඉක්මවිය යුතුය. එවැනි උපරිම සීමාව ඉක්මවා එවැනි කාර්යයන් ගෙන් ලැබෙන ලැබීම් ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මෙහි 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, මේ පනතෙහි, 2 වැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත, ඒ ඒ කාර්යය උඩ රජය විසින් කැරුන වියදම් එම මුදල් වර්ෂය තුළ එවැනි කාර්යයන් ගෙන් රජයට ලැබෙන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත් එවැනි වියදම් එම උප ලේඛනයේ 11 වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය.

(3) 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ, මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත කුමන කාර්යයක් හෝ සම්බන්ධ ඉතිරිව ඇති හර ශේෂය, උප ලේඛනයේ iv වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය. එසේ ම එම මුදල් වර්ෂය අවසානයේ දී එකී කටයුතු සඳහා වූ මුළු වගකීම, එම උප ලේඛනයේ v වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය.

4. 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, ඕනෑම අවස්ථාවක මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි, නියමිත කුමන හෝ කාර්යයකින් රජයට ලැබෙන ලැබීම් එවැනි කාර්යයන් සඳහා රජයෙන් කැරෙන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි වියදම් පියවීමට මුදල් ඇමති විසින් අවශ්‍ය යැයි හඟින ප්‍රමාණයන් විටින් විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජයට සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි මුදල් ඇමති විසින් නියෝගයකින් විධාන කළ හැකිය. එහෙත්, එසේ අත්තිකාරම් වශයෙන් දෙන මුළු ප්‍රමාණය එම උප ලේඛනයේ 11 වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම වැය ප්‍රමාණය නො ඉක්මවිය යුතුය. එවැනි කාර්යයක් සඳහා අත්තිකාරම් වශයෙන් දෙන යම් මුදලක්, මුදල් ඇමති විසින් නියෝගයකින් විධාන කරන පිළිවෙලට ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතුය.

5. මේ පනතේ පළමුවැනි උප ලේඛනයේ විධිවිධානානුසාරයෙන්, අංක 3, 5 සහ 7 යන වැය ශීර්ෂ වලට හැර එම උප ලේඛනයේ නියමිත අනෙක් ශීර්ෂයක් යටතේ දක්වෙන වෙනත් වැය ශීර්ෂයකට, වෙන් කැරුන යම් මුදලක් වැය කොට නොමැති නම්, හා වැය කැරෙන ලෙසක් නොපෙනෙන්නේ නම්, භාණ්ඩාගාරයේ ලේකම් ගේ හෝ ඔහු විසින් බලය පවරා ඇති වෙනත් ඕනෑම නිලධාරියෙකු ගේ හෝ නියෝගය අනුව, එම ශීර්ෂය යටතේ වූ වෙනත් කුමන හෝ වැය ශීර්ෂයකට පැවරිය හැකිය.

6. මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ ii වැනි, iii වැනි, iv වැනි හෝ v වැනි තීරුවල නියමිත උපරිම සීමාවන් රජයේ අනුමැතිය ඇතිව, 1969 අප්‍රියෙල් 30 වෙනි දට හෝ ඉන් පෙර මුදල් ඇමති විසින් නියෝග කිරීමෙන් වෙනස් කළ හැකිය. එවැනි කුමන හෝ නියෝගයක් එසේ ප්‍රකාශ කර ඇත්නම්, එහි නියම කළ හැකි එකී නියෝගය පැනවීමේ දිනට, පෙර දිනක සිට එකී නියෝගය ක්‍රියාත්මක වී ඇති බැව් සැලකිය යුතුය.

7. මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ, උචිත තීරු වලට යම් කටයුත්තක් සහ එවැනි කටයුත්තකට සම්බන්ධ සියළුම හෝ කුමන හෝ උපරිම ප්‍රමාණයන් එකතුකොට, පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකිය.

## උපලේඛනය පිළිබඳ සටහන්:

(අ) පළමුවැනි උපලේඛනය:

1967 ඔක්තෝබර් 1 වැනි දින සිට පටන් ගෙන 1968 සැප්තැම්බර් 30 වැනි දින අවසන් වන මුදල් වර්ෂයේ පොදු සේවාවන් සඳහා ඒ ඒ වැය ශීර්ෂ යටතේ ගෙවිය හැකි ප්‍රමාණයන් කොටස් කොට දක්වා ඇත.

මෙකී සේවා සඳහා ගෙවිය හැකි මුළු ප්‍රමාණය, රුපියල් දෙසිය හැටතුන් කෝටි දහසය ලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය හතලිස් හතක් (රු. 263,16,78,747.00) යයි ඇස්තමේන්තු කර ඇත.

මේ පනතේ 2 (1) වැනි වගන්තිය යටතේ පවරා ඇති බලය යටතේ මෙම මුදල වැය කළ හැකිය.

(ආ) දෙවැනි උප ලේඛනය:

එම මුදල් වර්ෂය සඳහා රජයේ යම් යම් කටයුතු සම්බන්ධයෙන් කැරුන මූල්‍ය ප්‍රතිපාදන බෙදා දක්වීමකි. මෙකී බෙදා දැක්වීමෙහි, ඒ ඒ කාර්යාල ආයතන හා දෙපාර්තමේන්තු යටතේ සහ එකී කාර්යාල, ආයතන හා දෙපාර්තමේන්තු වල යම් යම් රජයේ කාර්යයන් සම්බන්ධයෙන්, රජයේ කටයුතුවල උපරිම වියදම් සීමාව, රජයේ කටයුතු ගිණුම් වලට බැර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, රජයේ කටයුතු වල හර ශේෂයන් සඳහා උපරිම සීමාව, සහ රජයේ කටයුතු වල වගකීම් සඳහා උපරිම සීමාව නියම කර ඇත. මෙකී මුදල් වියදම් කිරීම හා බැර කිරීම මේ පනතේ 3 වැනි වගන්තිය යටතේ පවරා ඇති බලය යටතේ දී ඇති බෙදා දැක්වීම ප්‍රකාර සිදු කළ යුතුය.

## ලංකා සංවර්ධන මුදල් නීතිගත සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

**(සම්මත කළ දිනය 1967 මාර්තු මස 23 වැනි දින)**

1. මේ පනත 1967 අංක 1 දරන ලංකාවේ සංවර්ධන මුදල් නීතිගත සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හැඳින්විය හැකිය.

2. 1958 අංක 8 දරන පනතින් සංශෝධිත, (මෙහි මින්මතු "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකාවේ සංවර්ධන මුදල් නීතිගත සංස්ථා පනතෙහි 4 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:

(අ) "ලංකාවේ පෞද්ගලික කර්මාන්ත, කෘෂිකාර්මික හා වාණිජ ව්‍යාපාර දියුණු කිරීමෙහි, පිහිටුවීමෙහි, ව්‍යාප්ත කිරීමෙහි හා නවීකරණයෙහි ලා සහාය වීම; සහ"; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි –

(අ) "ලංකාවේ යම් කර්මාන්ත හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයක්" යන වචන වෙනුවට "ලංකාවේ යම් කර්මාන්ත, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපාරයක්" යන වචන; සහ

(ආ) "ලංකාවේ පෞද්ගලික කර්මාන්ත හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයක්" යන වචන වෙනුවට "ලංකාවේ පෞද්ගලික කර්මාන්ත, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපාරයක්" යන වචන ආදේශ කිරීමෙන්ද වේ.

3. ප්‍රධාන පනතෙහි 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (iii) වන ඡේදයෙහි "වෙනත් පෞද්ගලික ආයෝජන මාර්ග වලින්" යන වචන වෙනුවට "ආයෝජන මාර්ග වලින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියෙහි (iii) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ද වේ:-

"(iii අ) නීතිගත සංස්ථාවට මුදල් සම්බන්ධතාවයක් ඇති යම් ව්‍යාපාරයක පාලක මණ්ඩලයෙහි සේවය කිරීම පිණිස නීතිගත සංස්ථාවෙහි නියෝජිතයකු නම් කිරීම;"

4. ප්‍රධාන පනතේ 7 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි "රුපියල් සියය බැගින් වූ" යන්නෙහි සිට එම උප වගන්තියෙහි අවසානය දක්වා ඇති සියළු වචන වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"රුපියල් සියය බැගින් වූ සාමාන්‍ය කොටස් දෙලක්ෂ හතලිස් දහසකට වෙන් කරන ලද රුපියල් දෙකෝටි හතළිස් ලක්ෂයක් විය යුතුය."

5. ප්‍රධාන පනතේ 9 වන වගන්තියේ (5) වන උප වගන්තියෙහි "යම් පෞද්ගලික කර්මාන්ත හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයකට" යන වචන වෙනුවට "යම් පෞද්ගලික කර්මාන්ත, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපාරයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන පනතේ 10 වන වගන්තියේ (4) වන උප වගන්තියෙහි "හතරකට නො අඩු හා හයකට නො වැඩි වෙනත් අධ්‍යක්ෂවරු ගණනක් සිටිය යුතුය." යන වචන වෙනුවට "හයකට නො අඩු හා අටකට නො වැඩි වෙනත් අධ්‍යක්ෂවරු ගණනක් සිටිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන පනතෙහි 13 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි "මේ උප වගන්තිය යටතේ දෙනු ලැබූ යම් ණයක්" යන්නෙහි සිට "රජයට ආපසු ගෙවිය යුතුය;" යන්න දක්වා වූ සියළු වචන වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"මේ වගන්තිය යටතේ දෙනු ලැබූ යම් ණයක් රජය විසින් ඒ ණය මුදල දෙනු ලැබූ වර්ෂයෙන් පසුව පැමිණෙන විසිහය වන වර්ෂයෙහිදී පළමු කොටස අය විය යුතු, සමාන වාර්ෂික කොටස් පහළොවකින් නීතිගත සංස්ථාව විසින් රජයට ආපසු ගෙවිය යුතුය."

8. ප්‍රධාන පනතෙහි 14 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියෙහි,-

(අ) "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකු-වෙන්" යන වචන වෙනුවට "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ රජය විසින් අනුමත කරනු ලැබූ වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "රුපියල් දෙකෝටි හතළිස් ලක්‍ෂයකට සමාන මුදලට" යන වචන වෙනුවට "රුපියල් හත්කෝටි විසි ලක්‍ෂයකට සමාන මුදලට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙහි,-

(අ) "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ රජය විසින්" යන වචන වෙනුවට "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ රජය විසින් අනුමත කරනු ලැබූ වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උප වගන්තියේ අතුරු විධානයෙහි දැක්වෙන "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව හැර" යන වචන වෙනුවට "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව හෝ රජය විසින් අනුමත කරනු ලැබූ වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් හැර" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (5) වන උප වගන්තියෙහි "රජයත් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවත් අතරවූ සෑම ඇප ගිවිසුමක්ම" යන වචන වෙනුවට "රජයත් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවත් හෝ රජය විසින් අනුමත කරනු ලැබූ වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවි-ධානයකුත් අතර වූ සෑම ඇප ගිවිසුමක්ම" යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (6) වන උප වගන්තියෙහි "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව විසින් නීතිගත සංස්ථාවට දෙනු ලැබූ යම් ණයක් වූ විටක" යන වචන වෙනුවට "ප්‍රතිසංස් කරණය හා; සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව හෝ රජය විසින් අනුමත කරනු ලැබූ වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් විසින් නීතිගත සංස්ථාවට දෙනු ලැබූ යම් ණයක් වූ විටෙක" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ වගන්තියේ කෙළවරෙහි පහත සඳහන් අළුත් උප වගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(7) රජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව හෝ රජය විසින් අනුමත කරනු ලැබූ වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර වූ යම් ඇප ගිවිසුමක් රජය වෙනුවෙන් අත්සන් කිරීම සඳහා අග්‍රාණ්ඩුකාරවරයාට හෝ ස්වකීය අත්සන යටතේ වූ නීත්‍යානුකූල ලේඛනයක් මගින් අග්‍රාණ්ඩුකාරවරයා විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට මෙයින් බලය පවරනු ලැබේ.

(8) වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ රජය විසින් අනුමත කරනු ලැබූ වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් නීතිගත සංස්ථාව විසින් ලබා ගත හැකි යම් ණයක් පිළිබඳව නීතිගත සංස්ථාව විසින් ලියා අත්සන් කර දෙනු ලබන කිසිම ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ වෙනත් ලේඛනයක් කවරාකාරයකින් හෝ වූ යම් මුද්දර ගාස්තුවකට හෝ ගාස්තු වලට යටත් කිරීම හෝ ඒ සඳහා එබදු ගාස්තුවක් අය කිරීම නොකළ යුතුය.

(9) එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී මුදල් ඇමතිවරයා විසින් නීතිගත සංස්ථාවෙහි ගිණුම් ප්‍රකාශය පිළිබඳව ද මුදල් වර්ෂය ඇතුළත මේ පනත යටතේ ඇතුළත්වුනු හැම ණයකද, බැඳුම්කරයක ද, ඇපයක ද වාර්තාව උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ තැබීමට හැකි තරම් ඉක්මනින් කටයුතු සැලස්විය යුතුය."

9. ප්‍රධාන පනතේ 18 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "කෘෂිකාර්මික ව්‍යාපාරය" යන්නෙහි අර්ථ කථනයෙහි "වාණිජ පදනමක් මත කර ගෙන යන ව්‍යාපාරයක්" යන වචන වෙනුවට "වාණිජ පදනමක් මත සීමාසහිත වගකීම් ඇති සමාගමක් විසින් කර ගෙන යනු ලබන ව්‍යාපාරයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) "අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් අර්ථ කථනයන් ඇතුළත් කිරීමෙන්:-

"වාණිජ ව්‍යාපාරය" යන්නට කෘෂිකාර්මික හෝ කර්මාන්ත ව්‍යාපාරයක් පිළිබඳ විස්තරයට ඇතුළත් නො වන, ලංකාවේ ආර්ථික සංවර්ධනයට හේතු විය යුතු, සීමා සහිත වගකීම් ඇති සමාගමක් විසින් කර ගෙන යනු ලබන යම් විශාල ප්‍රමාණයේ ව්‍යාපාරයක් ඇතුළත් වේ;

"පාලක මණ්ඩලය" යන්නෙන්, එය ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ව්‍යාපාරයේ ව්‍යාපාරික කටයුතුවල හෝ කාර්යයන්හි නැතහොත්, ඉන් යම් කොටසක පාලනය හෝ පරිපාලනය තත් කාලයෙහි භාර ව සිටින කවර නාමයකින් හෝ අභිධානයකින් වුව ද හැඳින්වෙන යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"කර්මාන්ත ව්‍යාපාරය" යන්නෙන් වාණිජ පදනමක් මත සීමා සහිත වගකීම් ඇති සමාගමක් විසින් නිෂ්පාදක කාර්යයක් සඳහා කර ගෙන යනු ලබන විශාල ප්‍රමාණයේ ව්‍යාපාරයක් අදහස් වේ;"

**1967 අංක: 16, දරන මුදල් නීති (සංශෝධන) පනත**

**මුදල් නීති පනත සංශෝධනය කිරීමේ පනතකි.**

(සම්මත කළ දිනය - 1967 නොවැම්බර් 30)

1. මෙම පනත 1967 අංක: 16 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හැඳින්විය හැකිය.

2. "සියුම් රත්රන් ග්‍රෙන් එකකින් ග්‍රෙන්ස් දෙකයි සියයෙන් අසූ අටක් (2.88) ක් විය යුතුය" යන වචන වෙනුවට "සියුම් රත්රන් ග්‍රෑම් එකකින් දශම එකයි හතරයි නවයයි දෙකයි නවයයි හතක් (0.149297) විය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් මුදල් නීති පනතේ 3 වැනි වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

චක්‍රලේඛණ අංක: 24

ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590,
කොළඹ.
1967 මැයි මස 15 වැනි දින.

## ණය සඳහා මහ බැංකුවේ පොළී ප්‍රමාණය

(මුදල් නීති පනතේ 83 හා 87 වැනි වගන්ති හා සම්බන්ධවයි)

සමූපකාර සමිති වල (සමූපකාර සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කළ) වී නිපදවීමට සම්බන්ධිත භාවිතීය පොරොන්දු නෝට්ටු ඇප වශයෙන් ගෙන වෙළෙඳ බැංකු වලට මහ බැංකුව විසින් දෙන ණය වලට පොළිය, 1967 මැයි මස 15 වැනි ද සිට සියයට දෙකක් විය යුතුය. එසේ වුවද, මෙම පහසුකමින් ප්‍රයෝජන ගන්නා වෙළෙඳ බැංකු, එම නෝට්ටු වලට බැඳෙන්නන්ගෙන් වර්‍ෂයකට සියයට 9 කට වැඩි පොළියක් අය නොකළ යුතුය.

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩබ්ලිව්. තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

චක්‍රලේඛණ අංක: 21

(1967 ජූනි 18 වැනි දින සංශෝධිතයි)

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.
1967 ජූනි මස 18 වැනි දින.

## ණය සඳහා මහ බැංකුවේ පොළී ප්‍රමාණය

(මුදල් නීති පනතේ 83 හා 87 වැනි වගන්ති හා සම්බන්ධවයි)

වී, රතුලූනු, බොම්බයි ළූනු, මිරිස්, අර්තාපල්, අන්නාසි සහ එළවළු නිෂ්පාදනය හා සම්බන්ධ (සමූපකාර සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කැරුණ) සමූපකාර සමිති වල භාවිතිය පොරොන්දු නෝට්ටු ඇප වශයෙන් ගෙන වෙළෙඳ බැංකු වලට මහ බැංකුව විසින් දෙනු ලබන ණය සඳහා වාර්ෂික පොළිය, 1967 ජූනි මස 18 වැනි ද සිට සියයට දෙකක් විය යුතුය. එසේ වුවද, මෙම පහසුකමින් ප්‍රයෝජන ගන්නා වෙළෙඳ බැංකු, එම නෝට්ටු වලට බැඳෙන්නන්ගෙන් වර්ෂයකට සියයට 9 කට වැඩි පොළියක් අය නොකළ යුතුය.

කේ. ගුණරත්නම්
වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරි
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩබ්ලිව්. තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

චක්‍රලේඛණ අංක: 24
(1967 සැප්තැම්බර් 1 වැනි දින සංශෝධිතයි)

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.
1967 සැප්තැම්බර් 1 වැනි දින.

ණය සඳහා මහ බැංකුවේ පොළී ප්‍රමාණය

(මුදල් නීති පනතේ 83 හා 87 වැනි වගන්ති හා සම්බන්ධවයි)

වී, රතුළූනු, බොම්බයි ළූනු, මිරිස්, අර්තාපල්, අන්නාසි සහ එළවළු නිෂ්පාදනය හා සම්බන්ධ (සමූපකාර සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කැරුන) සමූපකාර සමිති වල හාවිතීය පොරොන්දු නෝට්ටු ඇප වශයෙන් ගෙන වෙළෙඳ බැංකු වලට මහ බැංකුව විසින් දෙනු ලබන ණය සඳහා වාර්ෂික පොළිය, 1967 සැප්තැම්බර් මස 1 වැනි ද සිට සියයට $1\frac{1}{2}$ ක් විය යුතුය. එසේ වුවද, මෙම පහසුකමින් ප්‍රයෝජන ගන්නා වෙළෙඳ බැංකු, එම නෝට්ටු වලට බැඳෙන්නන්ගෙන් වර්ෂයකට සියයට 8 කට වැඩි පොළියක් අය නොකළ යුතුය.

කේ. ගුණරත්නම්
වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරි
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

චක්‍රලේඛණ අංක: 25

ශ්‍රී ලංකා මහ බැංකුව,
රැජින වීදිය,
කොළඹ 1.
1967 සැප්තැම්බර් මස 20 වැනි දින.

## වෙළෙඳ බැංකු ණය

1960 අගෝස්තු 12 වැනි දින හා අංක: 11 දරන අපගේ චක්‍රලේඛය සම්බන්ධවයි.

යථෝක්ත චක්‍රලේඛණයේ 3 (ආ) 2 සහ 3 (ආ) 3 දරන ඡෙදයන්හි විධිවිධාන පහත සඳහන් කරුණු වල දී බලපාන්නේ නැත.

(අ) දේශ සංචාරක කර්මාන්තයෙහි පාවිච්චිය සඳහා 1967-6-1 වැනි දිනට පසුව ආනයනය කරන ලද මෝටර් රථ සහ 'ස්ටේෂන් වැගන්' කුලියට දීමට, කුලියට සින්නවීමේ ක්‍රම සපයන සමාගම් වලට දෙනු ලබන වෙළෙඳ බැංකු ණය, සහ

(ආ) දේශ සංචාරක කර්මාන්තයෙහි පාවිච්චිය සඳහා 1967-6-1 වැනි දිනට පසුව ආනයනය කරන ලද මෝටර් රථ සහ 'ස්ටේෂන් වැගන්' මිල දී ගැනීමේ කාර්යයන් උදෙසා මුදල් යෙදවීමට දෙනු ලබන වෙළෙඳ බැංකු ණය.

එසේ වුවද, ඉහත සඳහන් (අ) සහ (ආ) සම්බන්ධයෙන් අදාල රථ දේශ සංචාරක කර්මාන්තය සඳහා පාවිච්චි කිරීම පිණිස ආනයනය කරන ලද බවට ආනයන හා අපනයන පාලකගේ සහතිකයක්, ණය ලබා ගන්නා විසින් ණය දෙන බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

**කේ. ගුණරත්නම්**
වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරි.
ශ්‍රී ලංකා මහ බැංකුව.

**ඩබ්ලිව්. තෙන්නකෝන්**
අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

# ශ්‍රී ලංකා මහ බැංකුව

චක්‍රලේඛණ අංක: 1
1967 නොවැම්බර් 22 වැනි දින
(ප්‍රතිශෝධිතයි)

## මහ බැංකුවේ විනිමය අනුපාතිකය
(සම්බන්ධය: මුදල් නීති පනතේ 74 වැනි වගන්තිය)

1. මහ බැංකුව විසින් ලංකාවේ වෙළෙඳ බැංකු සමග කරනු ලබන ගනුදෙනු සඳහා පහත දැක්වෙන අනුපාතික අදාල වේ:-

| | විදුලි පුවත් මගින් කැරෙන පැවරීම් සඳහා මහ බැංකුවේ මිලට ගැනීම් අනුපාතිකයන් | විදුලි පුවත් මගින් කැරෙන පැවරීම් සඳහා මහ බැංකුවේ විකිණීම් අනුපාතිකයන්. |
|---|---|---|
| රන් පවුම් (ලංකා රුපියලට) | සි. පැ. | සි. පැ. |
| එතැන් | 1 $4\frac{53}{64}$ | 1 $4\frac{13}{16}$ |
| ඉදිරි (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම පැ. 1/128* | එතැන් සඳහා මසක අධිමිල පැ. 1/128* |
| ඉන්දියානු රුපියල් (ඉන්දියානු රුපියල් 100 ට) එතැන් | රු. $79\frac{1}{8}$ | රු. $79\frac{3}{16}$ |
| ඉදිරි (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම රුපියලකින් 1/32* | එතැන් සඳහා මසක අධිමිල රුපියලකින් 1/32* |

* කොන්ත්‍රාත්තු ගැනීම වෙළෙඳ බැංකුවේ අභිමතය පරිදි විය යුතුය. එහෙත්, කොන්ත්‍රාත්තු කාලය නිමවීමට පෙරනම්, එය ගත යුත්තේ කොන්ත්‍රාත්තු ගත් විනිමය අනුපාතිකය අනුවය.

2. වෙළෙඳ බැංකු සමග කැරෙන ගනුදෙනු වලට අදාල වන එ. ජ. ඩොලර් සඳහා වූ මහ බැංකු අනුපාතිකයන් නිත්‍යානුකූල සමානතා සමකයෙන් සියයට එකින් දෙකෙන් පංගුව ඇතුලත ප්‍රමාණයක වෙනසකට යටත්විය හැකිය. එවැනි වෙනස්කම් වන විට දී ඒ බව දැනුම් දෙනු ලැබේ.

3. මෙම චක්‍රලේඛණයෙහි විධිවිධාන, ඕනෑම අවසථාවක දී ඉවත් කිරීම, ඒවාට එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම හෝ කල හැකිය.

කේ. ගුණරත්නම්
වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරි.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

# ශ්‍රී ලංකා මහ බැංකුව

චක්‍රලේඛණ අංක: 2

1967 නොවැම්බර් 22 වැනි දින
ප්‍රතිශෝධිතයි.

## වෙළෙඳ බැංකු විනිමය අනුපාතික
(සම්බන්ධය:- මුදල් නීති පනතේ 76 වැනි වගන්තිය)

වෙළෙඳ බැංකු විසින් කරනු ලබන ගණුදෙනු සඳහා පහත දැක්වෙන විනිමය අනුපාතික අදාළ වේ.

| | අවම මිලට ගැණුම් අනුපාතික විදුලි පුවත් මගින් ශුද්ධ පැවරීම | අවම මිලට විකිණීම් අනුපාතික විදුලි පුවත් මගින් ශුද්ධ පැවරීම |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| රන් පවුම් (ප. 1 ට) | 14 · 19 | 14 · 30 |
| (අ) රන්පවුම් 100 හෝ ඊට අඩු ප්‍රමාණයන් සඳහා | (රුපියලට පැ. 4 29/32ට අනුරූපව) | (රුපියලට පැ. 4 25/32ට අනුරූපව) |
| (ආ) රන්පවුම් 100 ට වැඩි ප්‍රමාණයන් සඳහා | 14 · 22<br>(රුපියලට පැ. 4 29/32ට අනුරූපව) | 14 · 29<br>(රුපියලට පැ. 4 51/64ට අනුරූපව) |
| එක්සත් ජනපද ඩොලර් | මහ බැංකුවේ ගැනුම් අනුපාතිකයට වඩා අඩුවෙන් ඩොලර් 100 ම ශත 75 කට නොවැඩි විය යුතුය. | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට වඩා වැඩියෙන් ඩොලර් 100 ට රු. 1·50 ට නොවැඩි විය යුතුය. |
| ඉන්දියානු රුපියල් (ඉන්දියානු රුපියල් 100 ට) | 79 3/32 | 79 7/32 |
| පකිස්තානු රුපියල් (පකිස්තානු රුපියල් 100 ට) | 99 5/8 | 125 3/16 |

කේ. ගුණරත්නම්
වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරි.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛණ: 1/198

1967 නොවැම්බර් 22 වැනි දින

**ඒ. ජ. ඩොලරය සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතික**

මහ බැංකුව විසින් ලංකාවේ වෙළෙඳ බැංකු සමග කරනු ලබන ගනුදෙනු සඳහා නැවත දැනුම්දීමක් කැරෙන තෙක්, ඒ. ජ. ඩොලරය සම්බන්ධයෙන් පහත දැක්වෙන විනිමය අනුපාතික අදාළ වේ:-

| | විදුලි පුවත් මගින් කැරෙන පැවරීම් සඳහා මහ බැංකුවේ මිලට ගැනීම් අනුපාතිකයන් | විදුලි පුවත් මගින් කැරෙන පැවරීම් සඳහා මහ බැංකුවේ විකිණීම් අනුපාතිකයන් |
|---|---|---|
| ඒ. ජ. ඩොලර් (සියයකට) | | |
| එතැන් | රු. 592·25 | රු. 592·50 |
| ඉදිරි තෙමස තෙක් | රු. 592·25 | එතැන් සඳහා මසක අධිමිල ශත -/25 |

තෙමසකට වැඩි එහෙත් සමස තෙක් වන ප්‍රමාණයන් සඳහා මහ බැංකුවට විශේෂයෙන් ලියා ඉල්ලිය යුතුය.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

# ශුද්ධි පත්‍රය

2 වැනි සංඛ්‍යා සටහන

රජයේ රූපියල් මුදල් පිළිබඳ 1958 සංඛ්‍යාව වන −36·3, −36·4 යනුවෙන් නිවරද විය යුතුය.

රජයේ සුරැකුම් පත් සහ භාණ්ඩාගාර බිල් (ආ) සහ රජයේ ආනයන බිල් පිළිබඳ 1957 සංඛ්‍යාව වන 388·8, 338·8 යනුවෙන් නිවරද විය යුතුය.

4 වැනි සංඛ්‍යා සටහන (1)

(ඈ) අධෝලිපිය ඉවත් කළ සේ සැලකිය යුතුය.

4 වැනි සංඛ්‍යා සටහන (2)

කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු යටතේ "ලංකාණ්ඩුව සතු" යන්නට අදාළ 1964 සංඛ්‍යාව 30·9 ක් යනුවෙන්ද "නේවාසිකයන් සතු" යන්නට අදාළ 1964 සංඛ්‍යාව 508·6 ක් යනුවෙන්ද නිවරද විය යුතුය.

5 වැනි සංඛ්‍යා සටහන (1)

ලෝන හා අත්තිකාරම් – "අනෙකුත් අයට" යන්න යටතේ වූ 1960 වේ 20·6 සංඛ්‍යාව 21·0 යනුවෙන් නිවරද විය යුතුය.

9 වැනි සංඛ්‍යා සටහන

අංක (5) දරන අධෝ ලිපියෙහි 1 වැනි පෙළේ "1949 අංක 58 දරන මුදල් නීති පනතේ 93 හා 94 යන වගන්ති" යන්න "මුදල් නීති පනතේ 422 වැනි පරිච්ඡෙදයේ 10 ඈ 93, 94, 96 හා 97 යන වගන්ති" යනුවෙන් නිවරද විය යුතුය. අංක (5) දරන අධෝ ලිපියෙහි 3 වැනි පෙළේ "අවශ්‍යවෙයි" යන්නට අනතුරුව 1965 අංක 18 දරන පනතින් සංශොධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් බදු පනතේ 69 (අ) (2) (ආ) දරන වගන්තිය අනුව බැංකු, තමන් බාර ගන්නා විශේෂ තැන්පතු සඳහා සියයට 10 ක සංචිතයක්ද පවත්වා ගෙන යා යුතුය" යන්න ඇතුළත් විය යුතුය.

16 වැනි සංඛ්‍යා සටහන

ඉතිරි කිරීම් තැන්පතු යටතේ වෙළඳ බැංකු යන්නට අදාළ 1967 අගෝස්තු සංඛ්‍යාව වන 981·3, 681·3 යනුවෙන් නිවරද විය යුතුය.

32 වැනි සංඛ්‍යා සටහන

(1) 1967 නොවැම්බර් දෙසැම්බර් මාස ඉදිරියෙන් '*' ලක්ෂය බැගින් විය යුතුය. එයට අනුරූප අධෝලිපිය, පහත සඳහන් පරිදි විය යුතුය.

* 1967 නොවැම්බර් 22 වැනි දින ලංකා රුපියල සියයට 20 කින් අව ප්‍රමාණ කරන ලදී. 1967 නොවැම්බර් මාසයේ පටන් විදේශීය වත්කම් සංඛ්‍යා තොරතුරු ගණන් බලා ඇත්තේ අළුත් විනිමය අනුපාතිකය අනුවය.

(2) සංඛ්‍යා සටහනෙහි (ඈ) අධොලිපියේ දැක්වෙන '(රුපියල් කෝටි 37·13)' යන්නට ඉදිරියෙන් '**' ලක්ෂණය යෙදිය යුතුය. එයට අනුරූප අධෝ ලිපියක් වශයෙන්, පහත දැක්වෙන කොටස විය යුතුය.

** "1967 නොවැම්බර් 22 වැනි දින සියයට 20 කින් ලංකා රුපියල අවප්‍රමාණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ජා·මු·අ· හි ලංකාවේ සලාකය වන එ·ජ· ඩොලර් කෝටි 7·8 හි රුපියල් වටිනාකම දැන් රුපියල් කෝටි 46·43 ක් විය යුතුය."